# වාර්ෂික වාර්තාව

# ஆண்டறிக்கை

# Annual Report 2013







ශ්‍රම වාසනා අරමුදල

சிரமவாசனாநிதியம

**ShramaVasana Fund**

.



**97,** ජාවත්ත පාර කොළඹ **05.**

97, ஜாவத்தை வீதி, கொழும்பு-05.

**97,** Jawatta Road , Colombo-05



# පටුන ...


**01.කොටස** **පිටුව**

* මෙහෙවර හා දැක්ම 03
* කම්කරු ආමාත්‍යතුමාගේ සුභ පැතුම් පණිවිඩය 04
* සභාපතිතුමාගේ සුභ පැතුම් පණිවිඩය 05
* කම්කරු කොමසාරිස් ජෙනරාල්තුමියගේ සුභ පැතුම් පණිවිඩය 06
* සාමාන්‍යාධිකාරි තුමාගේ සුභ පැතුම් පණිවිඩය 07

**02.කොටස**

* පාලන ව්‍යුහය 08
* ශ්‍රම වාසනා අරමුදල හා එහි අරමුණු 09
* ශ්‍රම වාසනා අරමුදල සඳහා ලැබීම් 10
* ශ්‍රම වාසනා අරමුදලේ වර්ධනය හා ලොතරැයි ආදායම 11
* ශ්‍රම වාසනා අරමුදලේ වැඩසටහන් සමාලෝචනය 12

**03.කොටස**

* ශ්‍රම වාසනා අරමුදලේ අවසාන ගිණුම් 2013 16
* ශේෂ පත්‍රය 18
* ආදායම් වියදම් ගිණුම 19
* මුදල් ප්‍රවාහ ප්‍රකාශය 20
* ගිණුම් වලට අදාල සටහන් 21

**04.කොටස**

* විගණකාධිපති වාර්තාව 33

## මෙහෙවර හා දැක්ම ...

# දැක්ම (Vision)

“තෘප්තිමත් ශ්‍රම බලකායක්”

# මෙහෙවර (Mission)

“ව්‍යසනයන්හිදී පිහිට වෙමින් සේවක සුභසාධනය ප්‍රවර්ධනය ඉහළ නංවමින් යහපත් වැඩ බිමක් නිර්මාණය කිරීම”



## කම්කරු අමාත්‍යතුමාගේ සුභ පැතුම් පණිවිඩය ..

**1998** අංක **12** දරණ පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල කම්කරු අමාත්‍යාංශය යටතේ පවතින අතර එහි සභාපතීත්වය කම්කරු අමාත්‍යාංශයේ ලේකම් සතු වේ.

ශ්‍රම වාසනා අරමුදල විසින් පලකරනු ලබන වාර්ෂික වාර්තාවට කම්කරු අමාත්‍යවරයා ලෙස සුභපැතුම් පණිවිඩයක් ඉදිරිපත් කරන්නේ ඉතාමත් සතුටිනි.

රටක සංවර්ධනයට කාර්යක්ෂම හා ඵලදායී ශ්‍රම බලකායක් ඉවහල් වන අතර, මෙය සඵල කර ගැනීමට ඉතාමත් උනන්දුවෙන් හා කැපවීමෙන් ශ්‍රම වාසනා අරමුදල මඟින් දීප ව්‍යාප්තව සිදුකරනු ලබන වැඩසටහන් මා අගය කොට සලකමි.

සුවහසක් ශ්‍රමිකයන්ගේ අභිවෘර් ධිය උදෙසා ගන්නා වූ මේ ප්‍රයත්නයට උරදෙන අමාත්‍යාංශයේ ලේකම්තුමා, දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට හා ශ්‍රම වාසනා අරමුදලේ කාර්ය මණ්ඩලයට මාගේ ස්තූතිය පුදකරන අතර, යහ පාලනයක් තුලින් රටේ වැඩ කරන කම්කරු ජනතාවට මහඟු සේවාවක් කිරීමට ශ්‍රම වාසනා අරමුදලට හැකි වේවායි මා ප්‍රාර් ථනා කරමි!

ස්තූතියි

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනවිරත්න
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

# සභාපතිතුමාගේ සුභ පැතුම් පණිවිඩය .



කම්කරු අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් වන ශ්‍රම වාසනා අරමුදල විසින් පල කරනු ලබන 2013 වාර්ෂික වාර්තාවට සුභපැතුම් පණිවිඩයක් ලබා දීමට හැකිවීම මා ලද භාග්‍යයක් ලෙස සලකමි.

කම්කරු අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතන විසින් රටේ ආර්ථිකයේ අභිවෘද්ධියට විශාල දායකත්වයක් හා මිලියන 8.6 ක් පමණ වන සමස්ථ වැඩ කරන ජනතාව වෙනුවෙන් සිදු කරනු ලබන මෙහෙය සුවිශාල වේ.

මේ අතුරින් ශ්‍රම වාසනා අරමුදල පුද්ගලික අංශයේ සේවක සේවිකාවන්ගේ සුභසාධනය උදෙසාම පිහිටුවන ලද ආයතනයකි. එහි නිශ්චිත අරමුණු හා ඊට අනුශාංගික අරමුණු ඔස්සේ යමින් ශ්‍රමිකයන් පමණක් නොව ඔවුන්ගේ පවුල් සවිබල ගැන්වීමේ කාර්යයෙහි ද නියැලී කටයුතු කරනු ලබයි.

ශ්‍රම වාසනා අරමුදල විසින් දීප ව්‍යාප්තව වෛද්‍ය සායන පැවැත්වීම දැනුවත් කිරීමේ වැඩසටහන් හා වැඩපල ආරක්ෂණය ආදී අංශ වලින් විවිධ වැඩසටහන් සංවිධානය කරමින් අනතුරු හා අවදානම් කලින් හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය පූර්ව සැලසුම් සකස් කිරීම ප්‍රසංශනීය වේ.

මෙම වැඩ කටයුතු සාර් ථක කර ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දෙන කම්කරු අමාත්‍යාංශයේ, කම්කරු දෙපාර්තමේන්තුවේ සහ අනෙකුත් අනුබද්ධ ආයතනවල සියළුම කාර් ය මණ්ඩලයට මාගේ ස්තූතිය පුද කරමි. එසේම මෙම කටයුතු කළමනාකරණය කරමින් කැපවී කටයුතු කරන ශ්‍රම වාසනා අරමුදලේ සාමාන්‍යාධිකාරිතුමා ඇතුළු කාර් ය මණ්ඩලයටද මාගේ ස්තූතිය පුද කරමි.

එස්.එම්.ගෝඨාභය ජයරත්න
සභාපති - ශ්‍රම වාසනා අරමුදල
ලේකම් - කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය.

## කම්කරු කොමසාරිස් ජනරාල් තුමියගේ සුභ පැතුම



ශ්‍රම වාසනා අරමුදල විසින් පල කරනු ලබන 2013 වාර්ෂික වාර්තාවට සුභපැතුම් පණිවිඩයක් නිකුත් කරනු ලබන්නේ ඉමහත් සතුටිනි.

ශ්‍රම වාසනා අරමුදල පෞද්ගලික අංශයේ සේවක සේවිකාවන්ගේ සුභ සාධනය උදෙසා සුවිසල් කාර් ය භාරයක් ඉටු කරනු ලබයි. හදිසි අවස්ථා වලදි සේවකයින්ට උපකාර කිරීම, වෘත්තිය අනතුරු නිසා මරණයට හෝ පූර් න ආබාධිත තත්වයට පත්වන සේවක දරුදැරියන්ට ශිෂ්‍යත්ව ලබා දිම. ආයතන වසා දැමීම හෝ හදිසියේ සේවයෙන් පහ කරන සේවක සේවිකාවන් වෙනුවෙන් නීතී ආධාර ලබා දිම ආදී විශේෂිත වූ අරමුණු 6 ක් ඔස්සේ ශ්‍රම වාසනා අරමුදල සේවක සුභසාධනයට උපරිම දායකත්වයක් ලබාදේ.

මෙවැනි අරමුණු සාක්ෂාත් කරගැනිමට කටයුතු කරන කම්කරු අමාත්‍යාංශයේ ලේකම් තුමා ඇතුළු කාර් ය මණ්ඩලය, කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු කොමසාරිස්වරුන්, නියෝජ්‍යය කම්කරු කොමසාරිස්වරුන් සහ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්ය මණ්ඩලයට මාගේ කෘතඥතාවය පලකර සිටිමි.
එමෙන්ම ශ්‍රම වාසනා අරමුදලේ සියලුම කටයුතු කළමනාකරණය කරමින් එහි අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කරන සාමාන්‍යාධිකාරි තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට ද මගේ ස්තුතිය පුද කර සිටිමි.

චාන්දනි අමරතුංග
කම්කරු කොමසාරිස් ජනරාල්



## සාමාන්‍යාධිකාරී තුමාගේ සුභ පැතුම් පණිවිඩය .

ශ්‍රී ලාංකික වැඩ කරන ජනතාවගේ සුභ සිද්ධිය පිණිස ම ආරම්භ කරන ලද ශ්‍රම වාසනා අරමුදලේ 2013 වාර්ෂික වාර්තාවට සුභ පැතුම් පණිවිඩයක් නිකුත් කරන්නේ ඉතා සතුටිනි.

ශ්‍රම වාසනා අරමුදල ජාතික ලොතරැයි මණ්ඩලය හා ඒකාබද්ධව පවත්වනු ලබන ජාතික සම්පත ලොතරැයිය තුලින් අරමුදල් රැස් කර ලංකාව පුරා විසිරී සිටින මිලියන 8.6ක් පමණ වූ වැඩ වැඩ කරන ජනතාවට සුභ සාධනය සලසමින්,ඔවුන්ගේ පවුල් සවිබල ගැන්වීමේ ක්‍රියාවලියක 0 නියැලි සිටී.

දීප ව්‍යාප්ත කම්කරු කාර් යාල සහ දිස්ත්‍රික් කර් මාන්ත ශාලා පරීක්ෂක ඉංජිනේරු කාර් යාල හරහා නිරන්තර තොරතුරු සොයා බලමින් ශ්‍රමිකයින් හමුවට ගොස් ඔවුන්ගේ අවශ්‍යතා අනුව වෛද්‍ය සායන, අක්ෂි වෛද්‍ය සායන, දැනුවත් කිරීමේ වැඩසටහන්, පුහුණු වැඩසටහන් සහ සවිබල ගැන්වීමේ වැඩසටහන් සංවිධානය කරමින් ක්‍රියාශීලී සහ නිරෝගිමත් ශ්‍රම බලකායක් බිහිකිරීමට කටයුතු කරනු ලබයි.

මෙම කටයුතු කරගෙන යාමේදී ගරු කම්කරු අමාත්‍යතුමාගේ උපදෙස්, අමාත්‍යංශ ලේකම්තුමාගේ මඟපෙන්වීම් සහ කම්කරු දෙපාර්තමේන්තුවේ සහ අනෙකුත් අනුබද්ධ ආයතන වලින් අපට ලැබෙන සහයෝගය මම කෘතවේදීව සිහිපත් කරමි.

තවද මෙම කටයුතු සාර්ථකව කරගෙන යාමට අවශ්‍ය සහයෝගයත් උනන්දුවත් නිතරම දක්වන මාගේ කාර්ය මණ්ඩලයට ද මාගේ කෘතඥතාවය මෙහිදී ප්‍රකාශ කර සිටිමි.

ඩී.ආර්.ජයලත්.
සාමාන්‍යාධිකාරී,
ශ්‍රම වාසනා අරමුදල

# පාලන ව්‍යුහය ...

**1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල කම්කරු අමාත්‍යාංශය යටතේ පවතින අතර එහි සභාපතීත්වය කම්කරු අමාත්‍යාංශයේ ලේකම් සතු වේ.**

**ශ්‍රම වාසනා අරමුදල් පනතට අනුව අරමුදලේ පාලන කටයුතු පිළිබඳ සම්පූර්ණ වගකීම ශ්‍රම වාසනා අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති අතර අරමුදල කළමණාකරණය හා ඊට අදාල කටයුතු සියල්ලම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත.**

## අධ්‍යක්ෂ මණ්ඩලය - ශ්‍රම වාසනා අරමුදල

| නම | තනතුර |
|---|---|
| ඩබ්. ජේ. එල්. යූ. විජයවීර මහතා | සභාපති |
| පර්ල් වීරසිංහ මිය | සාමාජික |
| රංජිත් හෙට්ටිආරච්චි මහතා | සාමාජික |
| යූ. ලලිත් චන්ද්‍රසිරි වික්‍රමසිංහ මහතා | සාමාජික |
| පී. කේ. එම්. ජයතිස්ස මහතා | සාමාජික |
| එස්. ඩබ්. සී. ජයමිණී මිය | සාමාජික |
| ඩී. ආර්. ජයලත් මහතා | සාමාන්‍යාධිකාරී - ශ්‍රම වාසනා අරමුදල |
| ඊ. ඩබ්. ඒ. පී. පුණ්‍යසිරි | ගණකාධිකාරී - ශ්‍රම වාසනා අරමුදල |
| ඩබ්. ආර්. එම්. නලීන් අසංක මහතා | වෙළඳ නාම කළමණාකරු - ජාතික ලොතරැයි මණ්ඩලය |

# ශ්‍රම වාසනා අරමුදල සහ එහි අරමුණු ...

**1998 අංක 12 දරණ පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල කම්කරු අමාත්‍යාංශය යටතේ පවතින කම්කරු ප්‍රජාවගේ සුභ සාධනය උදෙසා ආරම්භ කරන ලද ආයතනයකි. ශ්‍රම වාසනා අරමුදල් පනතේ අරමුණු 6 ඔස්සේ ආරම්භයේ සිට මේ දක්වා විවිධ සුභ සාධන වැඩසටහන් පවත්වා ශ්‍රී ලාංකීය සේවා නියුක්තිකයන්ගේ උන්නතියට කටයුතු සම්පාදනය කර ඇත.**

**ශ්‍රම වාසනා අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ලබා දෙන අතර සෙනසුරාදා දිනුම් අදිනු ලබන ජාතික සම්පත ලොතරැයිය අලෙවියත් සමග ක්‍රම ක්‍රමයෙන් වැඩිවෙමින් පවතින අතර එම දායකත්වය වැඩි වීමත් සමඟ කම්කරු සුභ සාධනය උදෙසා සිදු කිරීමට නියමිත සේවාවන්ද මේ සමග වර්ධනය කර ගත හැක.**

**සේවා නියුක්තිකයන්ගේ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම.**

**සේවා නියුක්තිකයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම් දීමකින් තොරව වසා දැමූ අවස්ථාවක, ඒ සේවා නියුක්තයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම.**

**හදිසි අවස්ථාවල දී සේවා නියුක්තයන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම.**

**සේවා නියුක්තයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටක දී ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම.**

**ව්‍යසන අවස්ථාවල දී සේවා නියුකතයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ සැපයීම.**

**සේවා නියුක්තයන්ගේ සුභ සාධනය සඳහා විශිෂ්ට සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම.**

# ශ්‍රම වාසනා අරමුදල සඳහා ලැබීම් ...

අ) පාර්ලිමේන්තුව විසින් අරමුදලේ අරමුණු ඉටුකර ගැනීමේ කාර්යය සඳහා කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල්.

ආ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ප්‍රධාන, ත්‍යාග හෝ පරිත්‍යාග වශයෙන් ලැබෙන සියලුම මුදල්.

ඇ) අරමුදල මඟින් කරන ආයෝජන වලින් ආදායම වශයෙන් ලැබෙන මුදල්.


ඈ) 13 වන වගන්තියේ සඳහන් ලොතරැයි වලින් ලැබෙන මුදල් ද ඇතුලුව, මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේදී සහ කර්තව්‍ය ඉටු කිරීමේදී අරමුදලට ලැබෙන සියලු මුදල්.

ශ්‍රම වාසනා අරමුදල පෞද්ගලික අංශයේ සේවකයින් ආවරණය වන පරිදි පිහිටුවා ඇති අතර ස්වයං රැකියා කරනු ලබන පිරිස මෙමගින් ආවරණය නොවේ. ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය ධාරිතාව මත විවිධ වැඩසටහන් එක් එක් සීමාවන් තුළ ක්‍රියාත්මක කරනු ලැබේ. මූල්‍ය ධාරිතාව වැඩිවීමත් සමග එම සීමා වලින් ඔබ්බට තව දුරටත් සේවාවන් පුළුල් කිරීම 2011 වර්ශයේ සිට සිදු කරනු ලබයි.

රූප සටහන් 1

# <u>ශ්‍රම වාසනා අරමුදලේ වර්ධනය</u>


| | 2009 (මිලියන) | 2010 (මිලියන) | 2011 (මිලියන) | 2012 (මිලියන) | 2013 (මිලියන) |
|---|---|---|---|---|---|
| අරමුදලේවටිනාකම | 118 | 148 | 187 | 234 | 292 |
| අරමුදලේ වර්ධනය | 31 | 30 | 39 | 47 | 58 |




රූප සටහන් 2

# <u>ලොතරැයි ආදායම්</u>

| | 2009 (මිලියන) | 2010 (මිලියන) | 2011 (මිලියන) | 2012 (මිලියන) | 2013 (මිලියන) |
|---|---|---|---|---|---|
| ආදායම | 26 | 28 | 39 | 49 | 63 |
| ආදායම වර්ධනය | 3 | 2 | 11 | 10 | 14 |



# ශ්‍රම වාසනා අරමුදලේ වැඩසටහන් සමාලෝචනය

ශ්‍රී ලංකාව තුල ඇති වී තිබෙන සාමකාමී වාතාවරණය සහ දේශපාලන ස්ථාවරභාවය හේතු කොට ගෙන රටේ ආර්ථිකය වර්ධනය යහපත් ආකාරයෙන් සිදුවෙමින් පවතී. වර්තමානය වන විට විදේශ ආයෝජන විශාල පමාණයක් ශ්‍රී ලංකාව තුල ආයෝජනය කර ලංකාවම ආවරණය වන පරිදි අපනයන සැකසුම් කලාප ඇති වීමත් කර්මාන්ත ශාලා බිහිවීමත් තුලින් වසරින් වසර ශ්‍රම බලකාය වැඩි වෙමින් පවතී. මේ වන විට ලංකාවේ ශ්‍රම බලකාය මිලියන 9 කට ආසන්න ප්‍රමාණයක් වේ.

ශ්‍රම වාසනා අරමුදල විසින් පූර්ව නිශ්චිත අරමුණු 6ක් හා ඊට අනුශාංගික අරමුණු ඔස්සේ සේවක සුභසාධනය ඉහල නැංවීමට නිරන්තරව කටයුතු සිදු කරනු ලබයි.

* සේවා නියුක්තිකයන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම.

නිරෝගිමත් ශ්‍රම බලකායක් ඇතිකිරීමේ අරමුණින් කොග්ගල නිදහස් වෙළෙඳ කලාපය තුල පවත්වනු ලැබූ වෛද්‍ය සායනය.





* වෘත්තීය අනතුරු අවම කිරීම හා සුරක්ෂිත සේවා පරිසරයක් ඇතිකිරීමේ අරමුණින් පවත්වන ලද උපදේශාත්මක වැඩමුළු




* කම්කරු නීති අනපනත් හා සේවක සුරක්ෂිතතාවය පිලිබඳ දැනුවත් කිරීමේ දේශන පැවැත්වීම.




* ජාත්‍යාන්තර කාන්තා දිනයට සමගාමීව වැඩකරන කාන්තාවන් වෙනුවෙන් උපදේශාත්මක වැඩමුළු පවත්වා ඔවුන් සුරක්ෂිත කිරීම.





* වෘත්තීය අනතුරු හේතුවෙන් ජීවිතක්ෂයට හෝ පූර්ව බෙලහීනතාවයට පත්වූ දෙමාපියන්ගේ දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ලබා දීම.





* නීති ආධාර ලබා දීම.
* සේවා නියුක්තිකයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම් දීමකින් තොරව වසා දැමූ අවස්ථාවක, ඒ සේවා නියුක්තයන් වෘත්තීය පුහුණුවට යොමු කර නව රැකියා සඳහා යොමු කරවීම.
* ජාත්‍යාන්තර කාන්තා දිනයට සමගාමීව කාන්තාවන් නගාසිටුවීම හා ඔවුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
* නව සේවකයින් බඳවා ගැනීම හා අරමුදලේ අවශ්‍යතා අනුව ඔවුන් පුහුණු සැසිවලට යොමු කරවීම.

# ශ්‍රම වාසනා අරමුදල

# 2013

# අවසාන ගිණුම්

# ශ්‍රම වාසනා අරමුදල

# අවසාන ගිණුම් 2013

| අංකය | විස්තරය |
| --- | --- |
| 01. | මූල්‍ය වාතර්‍ාව |
| 02. | මූල්‍ය කාය‍ර් සාධන වාතර්‍ාව |
| 03. | මුදල් ප්‍රවාහ ප්‍රකාශ |
| 04. | පාද සටහන් |
| 05. | ශේෂ පිරික්සුම් |
| 06. | ස්ථාවර තුන්පතු විශ්ලේෂණය |
| 07. | ගිණුම් ශේෂ තහවුරු කිරීමේ ලිපි |

## ශ්‍රම වාසනා අරමුදල

ශ්‍රම වාසනා අරමුදල
මූල්‍ය වාතර්ාව
31 දෙසැම්බර් 2013 රු.

| | | 2013 | 2012 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | | 2,998,339.94 | 2,868,073.71 |
| ලැබිය යුතු දෑ | සටහන 2 | 234,189,105.24 | 170,561,863.33 |
| | | 237,187,445,18 | 173,429,937.04 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය | සටහන 1 | 56,000,000.00 | 61,500,000.00 |
| දේපළ යන්ත්‍ර හා උපකරණ | | 672,716.94 | 598,482.17 |
| | | 56,672,716.94 | 62,098,482.17 |
| මුළු වත්කම් | | 293,860,162.12 | 235,528,419.21 |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු දෑ | සටහන 4 | 1,720,385.95 | 926,504.56 |
| මුළු වගකීම් | | 1,720,385.95 | 926,504.56 |
| ශුද්ධ වත්කම් | | 292,139,776.17 | 234,601,914.65 |
| **ශුද්ධ වත්කම්** | | | |
| සමුච්චිත අරමුදල | සටහන 3 | 292,139,776.17 | 234,601,914.65 |
| ශුද්ධ වත්කම් | | 292,139,776.17 | 234,601,914.65 |

**ශ්‍රම වාසනා අරමුදල**

**මූල්‍ය තත්ත්ව වාර්තාව**
**2013.12.31 අවසන් වර්ෂය සඳහා**

| | | | |
|---|---|---|---|
| | | | රු. |
| | | 2013 | 2012 |
| **ආදායම්** | | | |
| ලොතරැයි ආදායම | සටහන 6 | 71,747,164.64 | 55,233,284.17 |
| මුළු ආදායම | | 71,747,164.64 | 55,233,284.17 |
| **වියදම්** | | | |
| පරිපාලන වියදම් | සටහන 7 | 3,589,779.44 | 3,431,371.97 |
| ක්ෂය වීම් | සටහන 8 | 222,865.23 | 134,397.00 |
| අරමුදලේ අරමුණු ඉටු කිරීමේ වියදම් | සටහන 9 | 10,396,658.45 | 4,466,175.82 |
| **මුළු වියදම්** | | 14,209,303.12 | 8,031,944.79 |
| **සමුච්චිත අරමුදල (අතිරික්තය 2013)** | | 57,537,861.52 | 47,201,339.38 |

## ශ්‍රම වාසනා අරමුදල

### මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2013.12.31 අවසන් වර්ෂය සඳහා**

| | රු. | |
|---|---|---|
| | 2013 | 2012 |
| **මෙහෙයුම් කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| වෂර්යේ අතිරික්තය | 57,537,861.52 | 47,206,939.38 |
| **මූල්‍ය නොවන වෙනස්වීම්** | | |
| ක්ෂය වීම් | 222,865.23 | 134,397.00 |
| වෙනත් ගෙවිය යුතු මුදල්වල වැඩි වීම | 793,881.39 | 711,504.56 |
| ආයෝජන පොළිය | (8,202,163.68) | (5,428,381.92) |
| ආපදා ණය පොළිය | (5,130.96) | (7,157.25) |
| වෙනත් ලැබිය යුතු දෑ වල වැඩි වීම | (63,469,420.00) | (49,811,460.00) |
| තොග වැඩි වීම | | 78,908.25 |
| **මෙහෙයුම් කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(13,122,106.50)** | **(7,115,249.98)** |
| **ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර වත්කම්,දේපළ යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම | (297,100.00) | (205,156.00) |
| ආයෝජන ආධායම් | 8,044,341.77 | 3,912,169.59 |
| ආපදා ණය | 5,130.96 | 7,157.25 |
| ආයෝජන | 5,500,000.00 | 6,000,000.00 |
| **ආයෝජන මුදල් ප්‍රවාහය** | 13,252,372.73 | 9,714,170.84 |
| මුදල් හා මුදල් සමාන දෑ වල වැඩි වීම හා අඩු වීම | 130,266.23 | 2,598,920.86 |
| 2013.01.01 දිනට මුදල් හා මුදල් සමාන වත්කම් | 2,868,073.71 | 269,152.85 |
| 2013.12.31 දිනට මුදල් හා මුදල් සමාන වත්කම් | 2,998,339.94 | 2,868,073.71 |

පාද සටහන්

**සටහන 01**

**දේපළ යන්ත්‍ර හා උපකරණ**

| | පිරිවැය | එකතු කිරීම් | ක්ෂය | සමු.ක්ෂය | ශු.අගය |
|---|---|---|---|---|---|
| යන්ත්‍ර හා උපකරණ | 240,480.00 | 177,100.00 | 41,578.00 | 94,490.00 | 323,090.00 |
| වායු සමීකරණ | 97,185.00 | - | 3,380.00 | 90,424.00 | 6,761.00 |
| පරිගණක | 456,334.00 | 120,000.00 | 144,084.00 | 447,485.50 | 128,848.50 |
| ඡායා පිටපත් යන්ත්‍ර | 96,187.50 | - | - | 96,186.50 | 1.00 |
| කායර්ාල උපකරණ | 261,723.14 | | 19,629.23 | 183,102.31 | 78,620.83 |
| | 1,341,162.64 | 297,100.00 | 222,865.23 | 965,545.70 | 672,716.94 |

**සටහන 02**

**අනෙකුත් ලැබිය යුතු දෑ**

| | |
|---|---|
| භාණ්ඩාගාර මෙ.අ.ජ. | 229,456,751.00 |
| උත්සව අත්තිකාරම් | 8,000.00 |
| ආපදා ණය | 92,820.00 |
| ස්ථාවර තැන්පතු ආයෝජන පොළී | 4,631,534.24 |
| | 234,189,105.24 |

**සටහන 03**

| | |
|---|---|
| සමුච්චිත අරමුදල 2013.01.01 | 234,601,914.65 |
| 2013 වෂර්යේ අතිරික්තය | 57,537,861.52 |
| සමුච්චිත අරමුදල 2013.12.31 | 292,139,776.17 |

**සටහන 04**

**අනෙකුත් ලැබිය යුතු දෑ**

| | |
|---|---|
| අතිකාල හා නිවාඩු දින දීමනා | 14,043.75 |
| තැපැල් හා සංනිවේදන | 12,941.73 |
| ජලය හා විදුලි බිල | 17,111.58 |
| අනෙකුත් සේවා | 109,250.00 |
| සුභ සාධන වියදම් | 200,000.00 |
| ආපදා අවස්ථා වලදී මූල්‍ය හා වෙනත් ආධාර ලබා දීම | 788,824.61 |
| ප්‍රචාරණ හා ප්‍රවධර්න වියදම් | 445,714.28 |
| නීති ආධාර | 132,500.00 |
| | 1,720,385.95 |

සටහන් 05

ස්ථාවර වත්කම් පහත ක්ෂය අනුපාත යටතේ ක්ෂය කරන ලදී.

| | |
|---|---|
| යන්ත්‍ර උපකරණ | **10%** |
| වායු සමීකරණ යන්ත්‍ර | **20%** |
| පරිඝණක | **25%** |
| ඡායා පිටපත් යන්ත්‍ර | **20%** |
| ලී බඩු උපකරණ | **7.5%** |
| කාර්යාල උපකරණ | **7.5%** |

සටහන් 06

ආදායම්

| | |
|---|---|
| ලොතරැයි ආදායම | **63,539,870.00** |
| ස්ථාවර තැන්පතු ආදායම | 8,202,163.68 |
| ආපදා ණය පොලී ආදායම | **5,**130.96 |
| | 71,747,164.64 |

සටහන් 07

පරිපාලන වියදම්

| | |
|---|---|
| වැටුප් හා වේතන | 1,158,381.27 |
| අතිකාල දීමනා | 47,629.01 |
| ජීවනාධාර දීමනා | 471,175.21 |
| වෙනත් දීමනා | 491,900.00 |
| ප්‍රසාද දීමනා | 37,500.00 |
| ගමන් වියදම් | 6,591.20 |
| ලිපි ද්‍රව්‍ය | 139,750.00 |
| ඉන්ධන | 274,365.00 |
| ප්‍රවාහන වියදම් | 371,932.00 |
| තැපැල් හා සන්නිවේදන වියදම් | 83,459.61 |
| වෙනත් වියදම් | 72,234.00 |
| ජලය හා විදුලිය | 173,539.94 |
| වෙනත් සේවා | 234,319.00 |
| නඩත්තු වියදම් | 27,003.20 |
| | 3,589,779.44 |

සටහන **8**

**ක්ෂය වීම්**

| | |
|---|---|
| **පරිසණක** | 144,084.00 |
| **වායු සමීකරණ** | 3,380.00 |
| **ලී බඩු උපකරණ** | 14,194.00 |
| **කාර්යාල උපකරණ** | 19,629.23 |
| **යන්ත්‍ර උපකරණ** | 41,578.00 |
| | 222,865.23 |

සටහන **9**

**අරමුදලේ ඉලක්ක ලඟා කර ගැනීම සඳහා දරණ ලද වියදම්**

| | | |
|---|---|---|
| **සේවා නියුක්තිකයන්ගේ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම** | 4,501,570.94 | |
| **සේවා නියුක්තිකයන්ට විරුද්ධ පරීක්ෂණ වලදී ආධාර කිරීම** | 276,680.00 | |
| **ආයතන වසා දැමූ අවස්ථා වලදී සේවා නියුක්තිකයන්ට ආධාර කිරීම** | 8,400.00 | |
| **ආපදා අවස්ථා වලදී මූල්‍ය හා වෙනත් ආධාර ලබා දීම** | | 4,676,221.81 |
| **ප්‍රචාරණ හා ප්‍රවර්ධන වියදම්** | 933,785.70 | |
| | 10,396,658.45 | |

ශ්‍රම වාසනා අරමුදල 2013 12.31.දිනට

**ශේෂ පිරික්සුම**

රු.

| | | හර | බැර |
|---|---|---|---|
| ස්ථාවර තැන්පතු මුදල | | **56,000,000.00** | |
| පරිගණක | | **576,334.00** | |
| වායු සමීකරණ යන්ත්‍රය | | **97,185.00** | |
| ඡායා පිටපත් යන්ත්‍රය | | **96,187.50** | |
| ලී බඩු උපකරණ | | **189,253.00** | |
| කාර්යාල උපකරණ | | **263,723.14** | |
| යන්ත්‍ර උපකරණ | | **417,580.00** | |
| ක්ෂය වෙන් කිරීම | | | |
| | පරිගණක | | 447,485.50 |
| | වායු සමීකරණ | | 90,424.00 |
| | ඡායා පිටපත් යන්ත්‍ර | | 96,186.50 |
| | ලී බඩු උපකරණ | | 53,857.39 |
| | කාර්යාල උපකරණ | | 183,102.31 |
| | යන්ත්‍ර උපකරන | | 94,490.00 |
| ක්ෂය | | | |
| | පරිගණක | **144,084.00** | |
| | වායු සමීකරණ යන්ත්‍රය | **3,380.00** | |
| | ලී බඩු උපකරණ | 14,194.00 | |
| | කාර්යාල උපකරණ | **19,629.23** | |
| | යන්ත්‍ර | 41,578.00 | |
| | ඒකාබද්ධ අරමුදල | **229,456,751.00** | |
| | උත්සව අත්තිකාරම් | 8,000.00 | |
| | ආපදා ණය | 92,820.00 | |
| බැංකු ශේෂය | | 2,998,339.94 | |
| සමුච්චිත අරමුදල | | | 234,601,914.65 |
| ලොතරැයි ආදායම් | | | 63,539,870.00 |
| ස්ථාවර තැන්පතු පොළී | | | 8,202,163.68 |
| ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී | | 4,631,534.24 | |
| ආපදා ණය පොළී | | | 5,130.96 |
| වැටුප් හා වේතන | | 1,158,381.27 | |
| වෙනත් දීමනා | | 1,000,575.21 | |
| අතිකාල හා නිවාඩු දින දීමනා | | 47,629.01 | |
| ගෙවිය යුතු අතිකාල හා නිවාඩු දින දීමනා | | | 14,043.75 |
| ගමන් ගාස්තු | | 6,591.20 | |
| ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය උපකරණ | | 139,750.00 | |

| | | |
|---|---|---|
| ඉන්ධන | 274,365.00 | |
| ප්‍රවාහන | 371,932.00 | |
| තැපැල් හා දුරකථන | 83,459.61 | |
| ගෙවිය යුතු තැපැල් හා දුරකථන | | 12,941.73 |
| වෙනත් වියදම් | 72,234.00 | |
| විදුලිය හා ජලය | 173,539.94 | |
| ගෙවිය යුතු විදුලිය හා ජලය | | 17,111.58 |
| යන්ත්‍ර උපකරණ නඩත්තු වියදම් | 27,003.20 | |
| වෙනත්සේවා | 234,319.00 | |
| ගෙවිය යුතු වෙනත් සේවා | | 109,250.00 |
| සුභ සාධනය | 4,501,570.94 | |
| ගෙවිය යුතු සුභ සාධනය කටයුතු | | 200,000.00 |
| නීති ආධාර | 276,680.00 | |
| නීති ආධාර සඳහා වෙන් කිරීම | | 132,500.00 |
| ආයතන වසා දැමූ අවස්ථාවලදී මූල්‍යාධාර ලබා දීම | **8,400.00** | |
| හදිසි අවස්ථාවලදී ලබා දෙන මූල්‍ය හා වෙනත් ප්‍රතිලාභ | **4,776,221.81** | |
| ගෙවිය යුතු හදිසි අවස්ථාවලදී ලබා දෙන මූල්‍ය හා වෙනත් ප්‍රතිලාභ | | **788,824.61** |
| ප්‍රචාරණ හා ප්‍රවර්ධන කටයුතු සඳහා | 933,785.70 | |
| ගෙවිය යුතු ප්‍රචාරණ හා ප්‍රවර්ධන | | **445,714.28** |
| | **309,035,010.94** | **309,035,010.94** |

ශ්‍රම වාසනා අරමුදල

**2013.12.31** වන දිනට ස්ථාවර තැන්පතු වාර්තාව

| තැන්පතු දිනය | බැංකුව | වටිනාකම | කල් පිරෙන දිනය | පොළී අනුපාතය | ලැබිය යුතු පොළිය |
|---|---|---|---|---|---|
| 2013.01.20 | HDFC | 6,000,000.00 | 2014.01.20 | 16.25% | 924,246.58 |
| 2013.03.29 | HDFC | 5,000,000.00 | 2014.03.29 | 15.50% | 590,273.97 |
| 2013.06.29 | HDFC | 4,000,000.00 | 2014.06.29 | 13.25% | 270,082.19 |
| 2013.07.18 | HDFC | 7,000,000.00 | 2014.07.18 | 12% | 384,328.77 |
| 2013.02.09 | NSB | 1,000,000.00 | 2014.02.09 | 15% | 133,972.60 |
| 2013.02.28 | NSB | 5,000,000.00 | 2014.02.28 | 15% | 628,767.12 |
| 2013.09.03 | NSB | 4,000,000.00 | 2014.09.03 | 12% | 157,808.22 |
| 2013.11.22 | NSB | 6,000,000.00 | 2014.11.22 | 11.50% | 75,616.44 |
| 2013.04.09 | BOC | 6,000,000.00 | 2014.04.09 | 14.50% | 636,410.96 |
| 2013.05.22 | BOC | 6,000,000.00 | 2014.05.22 | 13% | 478,684.93 |
| 2013.06.23 | BOC | 2,000,000.00 | 2014.06.23 | 13% | 136,767.12 |
| 2013.11.28 | BOC | 2,000,000.00 | 2014.11.28 | 11% | 20,493.15 |
| 2013.04.23 | People's Bank | 2,000,000.00 | 2014.04.22 | 14% | 194,082.19 |
| | | 56,000,000.00 | | | 4,631,534.24 |

# භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
## திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
## Department of Treasury Operations

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,මහලේකම් කාර්යාලය,
තැ.පෙ.1559, කොළඹ 01, ශ්‍රී ලංකාව.

நிதி திட்டமிடல் அமைச்சு, செயலகம்,
தபெ. 1559, கொழும்பு 01, இலங்கை

Ministry of Finance & Planning, The Secretariat,
P.O.Box: 1559, Colombo 01. Sri Lanka.

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம்; / Director General: 0094112484729, dgto@tod.treasury.gov.lk

ෆැක්ස් / பெக்ஸ் / Fax: 0094 112 484970

පොදු / பொது / General: 0094 112 484500, 0094 112 484600


මගේ අංකය / எனது இல / My No.: TO/REV/MIS/01/11

ඔබේ අංකය / உமது இல / Your No.:

දිනය / திகதி / Date: 2014.01.10

ශ්‍රම වාසනා අරමුදල
20 JAN
SHRAMA VASANA FU

සාමාන්‍යාධිකාරි,
ශ්‍රම වාසනා අරමුදල,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය,
කොළඹ 05.

**ඒකාබද්ධ අරමුදලට 2013.12.31 දිනට තැන්පත් කර ඇති මුදල් සාරාංශයක් ලබාගැනීම.**

ඉහත සඳහන් කරුණ සම්බන්ධයෙන් ඔබේ අංක ශ්‍ර/වා/විවිධ/07 හා 2014.01.08 දිනැති ලිපිය හා බැඳේ.

ශ්‍රම වාසනා අරමුදල වෙනුවෙන් ලොතරැයි මණ්ඩලය විසින් ඒකාබද්ධ අරමුදලට තැන්පත් කර ඇති මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| 2012.12.31 දිනට ශේෂය (2012 නොවැම්බර් දක්වා) | | | රු. 160,341,971.00 |
| 2012 | දෙසැම්බර් මාසය වෙනුවෙන් | රු. 5,575,960.00 | |
| 2013 | ජනවාරි | 4,179,800.00 | |
| | පෙබරවාරි | 4,798,280.00 | |
| | මාර්තු | 6,290,600.00 | |
| | අප්‍රේල් | 3,526,860.00 | |
| | මැයි | 3,544,300.00 | |
| | ජූනි | 5,964,400.00 | |
| | ජූලි | 7,110,160.00 | |
| | අගෝස්තු | 7,071,420.00 | |
| | සැප්තැම්බර් | 5,155,760.00 | |
| | ඔක්තෝබර් | 5,273,200.00 | |
| | නොවැම්බර් | 5,874,040.00 | |
| | | එකතුව | 64,364,780.00 |
| 2013.12.31 ශේෂය (2013 නොවැම්බර් දක්වා) | | | රු. 224,707,051.00 |

කේ.ඒ.ආනන්ද
අධ්‍යක්ෂ (ආදායම්)
භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.


*Additional Director General (Foreign Aid , Public Debt, Admin & Finance)* Tel : 0094 112 484738 Fax : 0094 112 320042

*Additional Director General (Consolidated Fund Mgt, Revenue & Reforms.)* Tel : 0094 112 484748 Fax: 0094 112 484970

*Director (Cash Management)* Tel: 0094 112484901 Fax: 0094 112 484970

*Director (Consolidated Fund Mgt)* Tel: 0094 112 484994 Fax: 0094 112 484970

*Director (Revenue)* Tel: 0094 112484638 Fax: 0094 112 484970

*Director (Foreign Aid Mgt)* Tel: 0094 112484751 Fax: 0094 112320042

*Director (Debt Mgt)* Tel: 0094 11248474 Fax: 0094 11232004

மக்கள் வங்கி මහජන බැංකුව PEOPLE'S BANK

දුරකථන / தொலைபேசிகள் / Telephones: 2594503, 2585454 (Fax)

අපේ යොමුව / எமது தொடர்பு / Our Ref.

ඔබේ යොමුව / உமது தொடர்பு / Your Ref. කළ/ඉගි/එ/නත්.

475/1 ඇල්විටිගල මාවත / எல்விட்டிகல மாவத்தை / Elvitigala Mawatha

නාරාහේන්පිට / நாராஹேன்பிட்டி / Narahenpita

කොළඹ / கொழும்பு / Colombo 05

2014.01.06

සාමාන්‍යාධිකාරි තුමා,
ශ්‍රම වාසනා අරමුදල,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය,
6 වන මහල,කම්කරු මහලේකම් කාර්යාලය,
කොළඹ 05.

මහත්මයාණෙනි,

ස්ථාවර තැන්පතුවල 2013.12.31 දිනට ශේෂය තහවුරු කිරීම.

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබගේ ශ්‍ර/වා/ගි/2/1/118 යොමුවැති 2014.01.03 දිනැති ලිපිය හා බැඳේ.

එම ලිපියට අනුව 2013.12.31 දිනට ශේෂ පහත දක්වමු.

| ස්ථිවර තැන්පතු ගි/අංකය | 2013.12.31 දිනට ශේෂය |
|---|---|
| 6001000048455 | රු.1,000,000/- |
| 6001000048464 | රු.1,000,000/- |

මෙම ලිපිය ඔබගේ ඉල්ලීම පරිදි නිකුත් කරන ලද බව කාරුණිකව සලකන්න.

මෙයට - විශ්වාස,

කළමනාකරු.

119 (108)

# மக்கள் வங்கி   මහජන බැංකුව   PEOPLE'S BANK


..கள் } 2594503
..ones } 2585454 (Fax)

..ජේ යොමුව
எமது தொடர்பு
Our Ref.

ඔබේ යොමුව/ඉගි/ඒ/නන්.
உமது தொடர்பு
Your Ref.

475/1 ඇල්විටිගල මාවත
எல்விட்டிகல மாவத்தை
Elvitigala Mawatha

නාරාහේන්පිට
நாராஹேன்பிட்டி
Narahenpita

කොළඹ
கொழும்பு } 05
Colombo


2014.01.06

සාමාන්‍යාධිකාරී තුමා,
ශ්‍රම වාසනා අරමුදල,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය,
6 වන මහල,කම්කරු මහලේකම් කාර්යාලය,
කොළඹ 05.

මහත්මයාණෙනි,

ජංගම ගිණුම් අංක 119-100103693128

---

ඔබ විසින් අප ශාඛාවේ පවත්වා ගෙන යනු ලබන ඉහත අංක දරණ ජංගම ගිණුමේ 2013.12.31 දිනට ශේෂය රු.3,057,363.84(cr) ක් බව කාරුණිකව දන්වමු.

මෙම ලිපිය ඔබගේ ඉල්ලීම පරිදි නිකුත් කරන ලද්දක් බැව් කාරුණිකව සලකන්න.

මෙයට - විශ්වාස,

කළමනාකරු.

NSB

(106)

Tel. 2503247

National Savings Bank
No. 255/7
Kirula Road
Narahenpita
Sri Lanka
07th January 2014

The Genaral Manager,
Shrama Wasana Fund,
6th Floor,
Labour Secretariat,
Narahenpita,
Colombo 05.

## CONFIRMATION OF BALANCE.

At the request of The Genaral Manager of Shrama Wasana Fund we do hereby confirm the balances of the following Fixed Deposit Accounts maintained with us as at 31.12.2013.

| Account Number | Name of the account | Balance as at 31.12.2013 |
|---|---|---|
| 01.2-0064-12-44418 | SHRAMA VASANA FUND | 1,000,000.00 |
| 02.2-0064-12-44388 | -DO- | 1,000,000.00 |
| 03.2-0064-12-44396 | -DO- | 1,000,000.00 |
| 04.2-0064-12-44370 | -DO- | 1,000,000.00 |
| 05.2-0064-12-44400 | -DO- | 1,000,000.00 |
| 06.2-0064-12-44361 | -DO- | 1,000,000.00 |
| 07.2-0064-12-54014 | -DO- | 1,000,000.00 |
| 08.2-0064-12-54049 | -DO- | 1,000,000.00 |
| 09.2-0064-12-54057 | -DO- | 1,000,000.00 |
| 10.2-0064-12-54065 | -DO- | 1,000,000.00 |
| 11.2-0064-12-54073 | -DO- | 1,000,000.00 |
| 12.2-0064-12-54022 | -DO- | 1,000,000.00 |
| | **Total: LKR** | **12,000,000.00** |

(Rupees Twelve Million Only)

Yours Faithfully

.......................
Manager 07/01/2014
Narahenpita Branch

National Savings Bank
No. 255/7, Kirula Rd.
Narahenpita,
Colombo - 5


ජාතික ඉතිරිකිරීමේ බැංකුව
ඉතිරිකිරීමේ මන්දිරය
තැ. පෙ. අංක 1732
255, ගාලු පාර,
කොළඹ 3.

දුරකථන: 2573008 - 15
ෆැක්ස් : 2379333

தேசிய சேமிப்பு வங்கி
சேமிப்பகம்
த. பெ. இல. 1732
255, காலி வீதி,
கொழும்பு 3.

தொலைபேசி : 2573008 - 15

NATIONAL SAVINGS BANK
Savings House
P.O. Box No. 1732
255, Galle Road,
Colombo 03.

Telephone : 2573008-15
Fax : 2379333

HDFC BANK

The Housing Bank...

HDFC BANK

අපේම නිවාස බැංකුව

எங்கள் வீடமைப்பு வங்கி

ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, තැ. පෙ. 2085, කොළඹ 02.

Sir Chittampalam A. Gardiner Mawatha, P.O. Box : 2085, Colombo 02.

சேர் சிற்றம்பலம் ஏ. காடினர் மாவத்தை, த.பெ. இல. 2085, கொழும்பு 02.

Phone : 011-2356800, 2447314, 2447354, 2446241, 2446239 Fax : 011-2356827, 2432190, 2356829 E-mail : hdfc@hdfc.lk Web : www.hdfc.lk

08-01-2014

General Manager,
Shrama Vasana Fund,
Colombo 05.

20 JAN

SHRAMA VASANA

Dear Sir,

**BALANCE CONFIRMATION - FIXED DEPOSITS**

This is to confirm that Chairman – Shrama vasana Fund has placed Fixed Deposits in our bank and it can be withdrawn at any time. The details of the Fixed Deposits as at 31/12/2013 are as follows.

| FD No | Deposited Amount (Rs.) | Maturity Date | FD No | Deposited Amount (Rs.) | Maturity Date |
|---|---|---|---|---|---|
| FD26100093 | 1,000,000/- | 18/07/2014 | FD26100165 | 1,000,000/- | 20/01/2014 |
| FD26100094 | 1,000,000/- | 18/07/2014 | FD26100166 | 1,000,000/- | 20/01/2014 |
| FD26100095 | 1,000,000/- | 18/07/2014 | FD26100167 | 1,000,000/- | 20/01/2014 |
| FD26100096 | 1,000,000/- | 18/07/2014 | FD26100168 | 1,000,000/- | 20/01/2014 |
| FD26100097 | 1,000,000/- | 18/07/2014 | FD26100169 | 1,000,000/- | 20/01/2014 |
| FD26100098 | 1,000,000/- | 18/07/2014 | FD26100170 | 1,000,000/- | 20/01/2014 |
| FD26100099 | 1,000,000/- | 18/07/2014 | FD26100186 | 1,000,000/- | 29/03/2014 |
| FD26100148 | 1,000,000/- | 29/06/2014 | FD26100187 | 1,000,000/- | 29/03/2014 |
| FD26100149 | 1,000,000/- | 29/06/2014 | FD26100188 | 1,000,000/- | 29/03/2014 |
| FD26100150 | 1,000,000/- | 29/06/2014 | FD26100189 | 1,000,000/- | 29/03/2014 |
| FD26100151 | 1,000,000/- | 29/06/2014 | FD26100190 | 1,000,000/- | 29/03/2014 |

This letter is issued on the request of Shrama vasana Fund.

Thanking You.

Yours Faithfully

.....................

Manager

Tel: 2368514
Fax: 2368515
Ref: Mgr:ysk

BANK OF CEYLON
Bankers to the Nation

NARAHENPITA BRANCH

(115)

07. 01. 2014.

The General Manager
Shrama Wasana Fund
6th Floor, Labour Secretariat,
Colombo 05 .

Dear Sirs,

FIXED DEPOSIT CONFIRMATION AS AT 31ST DECEMBER 2013
SHRAMA WASANA FUND

As requested by you we confirm below the balances in your under-mentioned fixed deposits as at 31st December, 2013:

| FD No. | BALANCE AS AT 31/12/2013 (Rs.) |
| --- | --- |
| 01. 74556640 | 1,000,000/- |
| 02. 74556658 | 1,000,000/- |
| 03. 74556669 | 1,000,000- |
| 04. 74556679 | 1,000,000/- |
| 05. 74556691 | 1,000,000/- |
| 06. 74556702 | 1,000,000/- |
| 07. 74688356 | 1,000,000/- |
| 08. 74688389 | 1,000,000/- |
| 09. 74688414 | 1,000,000/- |
| 10. 74688428 | 1,000,000/- |
| 11. 74688439 | 1,000,000/- |
| 12. 74688453 | 1,000,000/- |
| 13. 74789948 | 1,000,000/- |
| 14. 74789975 | 1,000,000/- |
| 15. 75382109 | 1,000,000/- |
| 16. 75382235 | 1,000,000/- |

Yours faithfully,

BANK OF CEYLON 0762 NARAHENPITA

MANAGER

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එල්එෆ් -1/සී/එස්වීඑෆ් /6/13/2 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2014 දෙසැම්බර් 31 දින

සභාපති,

ශ්‍රම වාසනා අරමුදල.

ශ්‍රම වාසනා අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.

---

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

පිටපත් - 01. ලේකම් - කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය

02. ලේකම් - මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එල්එස් -1/සී/එස්ව්එෆ්/6/13/2   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2014 දෙසැම්බර් 31 දින

සභාපති,
ශ්‍රම වාසනා අරමුදල

**ශ්‍රම වාසනා අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රම වාසනා අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල් පනතේ 12(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34   +94-11-2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 විගණන මතය

----------------

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ ස්ථාවර වත්කම් ක්ෂය ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කර නොතිබුණු අතර වර්ෂය තුළදී මිලදී ගත් රු.297,100ක් වටිනා වත්කම් මිලදී ගත් දිනය නොසලකා ක්ෂය කිරීම නිසා රු.14,785ක් වැඩියෙන් ක්ෂය කර තිබුණි.

(ආ) ප්‍රවර්ථන වර්ෂයේ මිලදී ගන්නා ලද ශබ්ද පද්ධති (sound system) සහ වීඩියෝ කැමරා වැනි වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය නිසි පරිදි තීරණය කිරීමකින් තොරව සියයට 10 බැගින් ක්ෂය කර තිබුණි.

### 2.3 නීති,රීති,රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල් පනත | |
| (i) 6(ඉ) වගන්තිය | ව්‍යසන අවස්ථාවලදී සේවා නියුක්තිකයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය හා වෙනත් ප්‍රතිලාභ සැපයීමකළ යුතු වුවද ප්‍රතිලාභ සපයා නොතිබුණි. |
| (ii) 13(1) වගන්තිය | එක් එක් වර්ෂයේ මුද්‍රණය කළ යුතු ලොතරැයි සංඛ්‍යාව හා වර්ගය පිළිබඳව ලොතරැයි මණ්ඩලය සමඟ එකගත්වයකට පැමිණිය යුතු වුවද එකඟතාවයකට පැමිණ නොතිබුණි . |

| | |
|---|---|
| (iii) 13(2) වගන්තිය | ලොතරැයියෙන් ප්‍රදානය කරන තෑගි පිළිබඳව හා හිමිකම් නොවූ තෑගි පිළිබඳව තහවුරු කළ ආකාරය පිළිබඳවද ලොතරැයි මණ්ඩලය සමඟ එකඟත්වයකට පැමිණිය යුතු වුවද එසේ කර නොතිබුණි. |
| (iv) 13(3) වගන්තිය | ලොතරැයියෙන් ප්‍රදානය කළ යුතු තෑගිවල වටිනාකම්ද ඇතුළුව ලොතරැයි මණ්ඩලය විසින් දැරියයුතු වියදම් සම්බන්ධයෙන් අරමුදල හා ලොතරැයි මණ්ඩලය සමඟ එකඟත්වයක් ඇතිකර ගත යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (v) 10(ඇ) වගන්තිය | ලොතරැයි පැවැත්වීමෙන් ලැබෙන ආදායම් අරමුදලට ලැබිය යුතු වුවත් 2008 ඔක්තෝබර් මාසයෙන් පසුව එම ආදායම් මහා භාණ්ඩාගාරයෙන් ලබා නොගැනීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ආදායම රු. 229,456,751 ක් විය. |
| (ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 3 වෙනි උපලේඛනයේ 2.1 ඡේදය | විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) 2002 දෙසැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

## 3 මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.57,537,862 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.47,201,339 ක් වූයෙන් රු.10,336,523 ක මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයක් පෙන්නුම් කෙරිණි. සමාලෝචිත වර්ෂයේ වියදම පසුගිය වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 6.18 කින් වැඩි වුවත්, සමාලෝචිත වර්ෂයේ ආදායම රු. මිලියන 16.5 කින් වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

-----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ලද ආදායමෙන් සියයට 80.20 ක ප්‍රමාණයක් ඉතිරි කර තිබූ අතර අරමුදලේ අරමුණු ඉටුකිරීම වෙනුවෙන් වැය කර ඇත්තේ මුළු ආදායමෙන් සියයට 14.49 ක ප්‍රමාණයක් පමණක් බව නිරීක්ෂණය විය.

**4 මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**4.1 කාර්යසාධනය**

----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිති ආධාර ලබාදීමේ වැඩසටහන හා ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා වර්ෂය තුළ ඉලක්ක ගත කර තිබූ ප්‍රතිලාභීන් ගණන 200 දෙනෙකු පමණක් වන අතර, ශ්‍රී ලංකාවේ පුද්ගලික අංශයේ ශ්‍රම බලකාය හා සැසඳූ විට එය ප්‍රමාණවත් නොවූ බව නිරීක්ෂණය විය.

(ආ) සැලසුම් කළද කාර්මික අනතුරු පිළිබඳ වෛද්‍ය සහන සේවා වැඩසටහන / කාර්මික සෞඛ්‍ය සහ ප්‍රදාන, මූල්‍යාධාර හෝ වියලි සලාක වැඩසටහන (Medical assistance Programs Industrial accidents/Industrial Health & Awards, Financial Aid or Dry ration Work) වර්ෂය ඇතුළත ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් සම්මත කළ පනතක් අනුව පිහිටවූ මෙම ආයතනයේ ප්‍රතිලාභ දිවයින පුරා සේවයේ නියුතු සියළු සේවකයින්ට පනතේ අරමුණු ප්‍රකාරව සේවා සැපයීම ආයතනයේ ප්‍රධානම කටයුත්තක් විය. පසුගිය වර්ෂ කිහිපය තුළදී හා මෙම වර්ෂයේදී අදාළ ආයතනයේ ප්‍රතිලාභ වලින් සියයට 75 කට වැඩි ප්‍රමාණයක් ලබාදී ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කය තුළ සේවකයන්ට වීමෙන් ආයතනයේ අරමුණු ළඟාකර ගැනීමේදී දිප ව්‍යාප්ත සේවයක් ඉටුකිරීමට පසුගිය වර්ෂ කිහිපය තුළදී මෙන්ම මෙම වර්ෂයේදී ද අපොහොසත් වී තිබුණි.

**4.2 ආර්ථික නොවූ ගනුදෙනු**

---------------------------

නිති ආධාර ක්‍රමය ප්‍රචාරණය සඳහා රු. 169,680 ක් වැයකර තිබුණු අතර ලබාදී තිබූ ආධාර ප්‍රමාණය රු. 50,000 කි. ආධාර ලබාදීමේදී රු.15,000 කට වඩා අඩු මාසික වැටුප් ලබන සේවකයන් පමණක් සලකා බැලීම හේතු කොටගෙන මෙම තත්ත්වය ඇතිවී තිබුණි.

**4.3 විධිමත් පරිදි පවරා නොගත් කාර්යාල ගොඩනැගිල්ල**

---------------------------------------------------

කාර්යාල ගොඩනැගිල්ලේ නිත්‍යානුකූල අයිතිය විගණන දිනය දක්වා කම්කරු දෙපාර්තමේන්තුව විසින් ශ්‍රමවාසනා අරමුදලට පවරා දීමට කටයුතු කර නොතිබූ අතර ගොඩනැගිල්ල සඳහා ගෙවිය යුතු කුලිය, ජල හා විදුලි වියදම පිළිබඳ කම්කරු දෙපාර්තමේන්තුව සමඟ එකඟත්වයකටද එළඹ නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය මඟින් පත්කර නොතිබූ බැවින් ප්‍රවර්තන වර්ෂය තුළ කිසිදු අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

අ. අරමුදල් කළමනාකරණය.

ආ. කාර්යසාධනය

ඇ. අභ්‍යන්තර විගණනය.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)